# උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ , පළාත් ආදායම් සේවයේ II වන ශ්‍රේණියේ බදු නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පළාත් ආදායම් සේවයේ II වන ශ්‍රේණියේ බදු නිලධාරී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025.10.25** වන අතර, බඳවා ගැනීමේ තරඟ විභාගය 2025. නොවැම්බර් මස අනුරාධපුර නගරයේදී පවත්වනු ඇත.

**පුරප්පාඩු සංඛ්‍යාව - 11**

**01. අයදුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් -**

**1.1 අධ්‍යාපන සුදුසුකම් -**

**අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පෙර අයදුම්කරු පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් උපාධියක් ලබා තිබීම.

**1.2. සාමාන්‍ය සුදුසුකම්**

i. අයදුම්කරු /අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක අඛණ්ඩ ස්ථිර පදිංචියක් උතුරු මැද පළාත් සභා බල ප්‍රදේශය තුළ තිබිය යුතුය.
(ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචි සහතිකය DS4 මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පදිංචිය සනාථ කළ යුතුය. කලත්‍රයාගේ ස්ථිර පදිංචිය වුවද සලකා බැලේ)

iii. සෑම අයදුම්කරුවෙකුම මනා සෞඛ්‍ය තත්වයකින් හා යහපත් චරිතයකින් ද යුක්ත විය යුතුය.

**1.3. සුදුසුකම් පිළිබඳ සීමා**

යම් ආගමික නිකායක පැවිදි වරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නැත.

**02. වයස -**

අයදුම්කරුගේ වයස ඉල්ලුම්පත්‍රය භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය. (දැනටමත් උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරේ ස්ථිර කර ඇති නිලධාරීන්ට උපරිම වයස් සීමාව අවුරුදු 35කි).

**03. වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව MN 5 – 2025 රු.58,660 – 1,190x10 – 1,360x11 - 1,670x15 – 110,570/-

**04. බඳවා ගැනීමේ ක්‍රමය -**

ලිඛිත විභාගයෙන් සමත් අයදුම්කරුවන් අතුරින් කුසලතාවය අනුව ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් සුදුසුකම් පරීක්ෂාකිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසුව නියමිත පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව අවස්ථාවෝචිත පරිදි පත් කිරීම් බලධරයා විසින් තීරණය කරනු ඇත.
"කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේදී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගත් සුදුසුකම්ලත් අපේක්ෂකයින් සිටී නම් හා එම පුරප්පාඩුව ද පිරවීමේ සේවා අවශ්‍යතාවයක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයින් අතුරින් වැඩිදුර තෝරාගැනීමක් සිදුකිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය."

**05. තරඟ විභාගයේ විෂය නිර්දේශය -**

මෙම පරීක්ෂණය පහත සඳහන් පරිදි ප්‍රශ්ණ පත්‍ර දෙකකින් සමන්විත වේ.

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 40 |
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

**පවත්වනු ලබන බලධාරියා :** උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**06. විභාගය පවත්වන භාෂා මාධ්‍යය.**

මෙම විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.

**07. විභාගය සඳහා වන විෂය නිර්දේශය:**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| **සාමාන්‍ය දැනුම** | ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සහ සංවර්ධනයට අදාළ ගැටළු ප්‍රමුඛ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික රටාව හා ජාතික මෙන්ම අන්තර්ජාතිකව ද වැදගත් වන නූතන කරුනු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය ද සම්බන්ධයෙන් අපේක්ෂකයා සතු දැනීම පිරික්සීම සඳහා වූ ප්‍රශ්ණ පත්‍රයකි. |
| **බුද්ධි පරීක්ෂණය** | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තත්වය, තීරණ ගැනීමේ හැකියාව, විශ්ලේෂණය කිරීමේ හැකියාව ආදිය මැන බැලීම සඳහා සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්ණ පත්‍රයකි. |

**08. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:**

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

ii. තෝරාගනු ලබන අයදුම්කරුවන් දැනට රජයේ සේවයේ නියුක්ත නොවන්නේ නම් ඔවුන් තුන් අවුරුදු පරිවාස කාලයක් මත අදාළ තනතුරට පත් කරනු ඇත.

iii. දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරාගනු ලැබුව හොත් ඔහුගේ පත්වීම එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වනු ඇත.

iv. තනතුරේ ස්ථිර කිරීම සඳහා උතුරු මැද පළාත් ආදායම් සේවා ව්‍යවස්ථාවේ උපග්‍රන්ථයේ 1(අ) ඡේදයේ සඳහන් යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් විය යුතු අතර, සමත් වූ නිලධාරීන් ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදය ප්‍රකාරව ස්ථිර කිරීම සිදු කෙරේ.

v. බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් 2020.10.16 දිනැති අංක 18/2020 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව තමන් සේවයට බැඳී වසර 05ක් ඇතුලත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව / භාෂා පිළිබඳව නියමිත ප්‍රවීණතාව ලබාගත යුතුය.

**09. ඉල්ලුම් කළ යුතු පිළිවෙල:**

මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව A4 ප්‍රමාණයේ ( සෙ.මී.21 x25) කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ඉල්ලුම් පත්‍රය සකස් කරගත යුතුය. (ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල හා දෙමළ ඉල්ලුම්පත්‍ර වල සිංහල හා දෙමළ භාෂාවෙන් යෙදීම අවශ්‍ය වේ.) ඉල්ලුම් පත්‍රයේ අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තම ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2025.10.25.දින හෝ ඊට පෙර ලැබෙන සේ **" ලේකම්, උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"බඳු නිලධාරි තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය - 2025 "** යනුවෙන් සඳහන් කළ යුතුය.

**10. අයදුම්පත් භාර ගැනීම:**

නියමිත ආකෘතියට අනුකූල නොවන, අසම්පූර්ණ, සුදුසුකම් සපුරා නැති අයදුම්පත් ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සහ තැපැල්දී අස්ථානගත වන අයදුම්පත් පිළිබඳව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සම්බන්ධයෙන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

**11.** මෙම නිවේදනයේ සඳහන් කර ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් හට සහතිකපත්‍ර පරීක්ෂා කිරීමකින් තොරව තරඟ විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට වූ පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. පළාත් රාජ්‍ය සේවයේ තනතුරක් දරන නිලධාරියෙකු අයදුම්කරුවෙකු වන්නේ නම් ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය තමා සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය. එසේ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**12. විභාග ගාස්තු :**

රු. 720/- ක විභාග ගාස්තුවක් අයදුම්කරු උතුරු මැද පළාත තුළ පිහිටි ඕනෑම කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ඒ සඳහා ලබා ගත් ලදුපත (NC – 100) ඉල්ලුම්පතෙහි නොගැලවෙන සේ ඇලවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත හැර වෙනත් ආයතන වලට මුදල් ගෙවා ලබාගන්නා ලදුපත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ. (මෙම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ උතුරු මැද පළාත් සභාවේ අංක 2003.02.13 දරණ ආදායම් ශීර්ෂයට බැර වන ලෙසටය.) මෙම ලදුපත නොමැතිව ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව ද සැලකිය යුතුය. මුදල් ගෙවා ලබාගත් ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ

**13. විභාගයට පෙනී සිටීම :**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් අයදුම්කරුවන්වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය පවත්වන දිනට ප්‍රථම තම ප්‍රවේශ පත්‍ර නොලැබුණ අපේක්ෂකයින් වෙතොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ඒ පිළබඳ විමසිය යුතුය. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී, පෙනී සිටින සෑම විෂයක් පාසාම, විභාග ශාලාධිපති වෙත තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු අතර , ඒ සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණි. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන සියලුම නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතුය. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**14. සාවද්‍ය තොරතුරු සැපයීම :**

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. යම් හෙයකින් තෝරා පත්කර ගැනීමෙන් පසුව කිසියම් තොරතුරක් සාවද්‍ය බව පෙනී ගියහොත් ඔහු/ ඇය සේවයෙන් පහකරනු ලැබේ.

**15.** මෙම විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
2025.09.25

.

**<u>උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ, පළාත් ආදායම් සේවයේ II වන ශ්‍රේණියේ බදු නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2025</u>**

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]

සිංහල - S දෙමළ - T
(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න. මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ)

01. i. මුලකුරු අගට යොදා අයදුම්කරුගේ නම : ..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

ii. මුලකුරු අගට යොදා අයදුම්කරුගේ නම : ..........................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

02. මුලකුරු වලින් හැඳින්වෙන නම් : ..........................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

03. i. ස්ථිර ලිපිනය : ..........................................................................................

04. i.විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : ..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

ii. විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : ..........................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

05. උපන් දිනය

වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස (2025.10.25)

අවු : [ | ] මාස: [ | ] දින : [ | ]

06. ස්ත්‍රී පුරුෂ භාවය : [ ]
ස්ත්‍රී - 1 පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුල ලියන්න)

07. විවාහක අවිවාහක බව : [ ]
අවිවාහක - 1 විවාහක - 2
(අදාළ අංකය කොටුව තුල ලියන්න)

08. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | ]

09. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේඋපතින්ද? ලියා පදිංචි වීමෙන්ද? :..........................................................................

i. අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..........................................................................

ii.ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය :..........................................................................

iii.ග්‍රාම නිලධාරී කොට්ඨාශය :..........................................................................

Iv. පළාත තුල පදිංචිව සිටින කාල සීමාව :......................දින සිට.......... දින දක්වා

අවුරුදු ................ මාස.......................

10. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් පරිදි ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්.(අදාළ සහතික පිටපත් අමුණා එවිය යුතුයි.)

10.1. අ.පො.ස (සා.පෙළ) වර්ෂය:-................ විභාග අංකය:-.................

| | විෂය | සාමාර්ථය | | විෂය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| I. | .......................... | .................. | VI. | .......................... | .................. |
| II. | .......................... | .................. | VII. | .......................... | .................. |
| III. | .......................... | .................. | VIII. | .......................... | .................. |
| IV. | .......................... | .................. | XI. | . .......................... | .................. |
| V. | .......................... | .................. | X. | .......................... | .................. |

10.2. අ.පො.ස (උ.පෙළ) වර්ෂය:-................ විභාග අංකය:-.................

| | විෂය | සාමාර්ථය |
|---|---|---|
| I. | ................................ | ............ |
| II. | ................................ | ............ |
| III. | ................................ | ............ |
| IV. | ................................ | ............ |

10.3.

| සමත් උපාධිය හා ප්‍රධාන විෂයන් | උපාධිය හෝ විභාගය වලංගු වන දිනය | ලැබූ පංති සාමාර්ථතාව | විශ්ව විද්‍යාලයේ හෝ ආයතනයේ නම |
|---|---|---|---|
| | | | |

11. අයදුම්කරු විසින් කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර (අදාළ වේ නම්)

| දෙපාර්තමේන්තුව/ආයතනය | තනතුර | කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

12. විභාග ගාස්තු රු.720/- ගෙවූ බවට අදාළ තොරතුරු :

i.විභාග ගාස්තු ගෙවූ ලදු පතේ අංකය :........................................

ii. දිනය :........................................

iii. ලදුපත ලබා ගත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය :........................................

| ලදුපත නොගැලවෙන සේ මෙම කොටුව තුළ අලවන්න.<br>(ලදු පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත) |
|---|

13. ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියකින් දඬුවම් ලබා ඇතිද? ...............................

එසේනම් විස්තර දක්වන්න.........................................................................

.............................................................................................................

14. මෙම අයදුම්පතේ මම විසින් සඳහන් කරන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳව දක්වා ඇති කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව හෙලිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය :........................ ........................................

අයදුම්කරුගේ අත්සන

15. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්. ඔහු/ඇය................................. වන දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදු පත ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවත් සහතික කරමි.

.........................................
සහතික කරන්නාගේ අත්සන

දිනය :........................

සහතික කරන්නාගේ නම :.............................................................

තනතුර හා නිල මුද්‍රාව :.............................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය).

**රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.**

මෙම අයදුම්කරු වන .........................................................මයා/මිය/මෙනවිය....................................වශයෙන් දැනට.........................................කාර්යාලයේ / ආයතනයේ සේවය කරන බව ද, ඔහුගේ/ඇයගේ සේවය ස්ථිර කර ඇත/ නැත ඔහු/ඇය මොනයම් ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව ද මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි බව ද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ද සහතික කරමි.

........................................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන
නම
තනතුර හා නිල මුද්‍රාව

දිනය :........................